සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MF/WBB/2/Notice?D/Div.s./2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.07. 27 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**<u>අස්වැසුම ප්‍රතිලාභීන්ගේ ජාතික හැඳුනුම්පත නොමැතිවීම සම්බන්ධයෙන් මතුව ඇති ගැටළු විසඳීම</u>**

අද දින (2023.07.27) ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී, සාගල රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේදී දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් ගේ නියෝජනයන් සහිතව හා බැංකු නිලධාරීන් සමඟ පැවැත්වූ සාකච්ඡාවේදි මතු වූ උක්ත ගැටළුව හා සුබසාධක ප්‍රතිලාභීන් සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම මැයෙන් යුතු 2023.06.17 දිනැති ලිපිය හා එම කරුණට අදාළව නිකුත් කරන ලද ලිපිවලට වැඩිමනත් වශයෙනි.

02. "Open Account"ලෙස සඳහන්ව ඇති ප්‍රතිලාභීන්ට අදාළ බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා ලිපි නිකුත් කිරීමේදී එම ප්‍රතිලාභියාගේ ජාතික හැඳුනුම්පත නැති වී හෝ අස්ථානගත වී හෝ විනාශ වීම හේතුවෙන් පහත ගැටළුව වාර්තා වී ඇත.

- පද්ධතියෙහි ජාතික හැඳුනුම්පත අංකය ඇතුළත් කර ඇතත් එම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ නොහැකිවීම.

ඒ සඳහා පද්ධතිය මගින් ජනිත වූ ලිපියේ සඳහන් වන ජාතික හැඳුනුම්පත් අංකය කපා හැඳුනුම්පතක් නොමැති බවට සඳහන් කර, ප්‍රාදේශීය ලේකම් අත්සනින් යුතු ලිපිය හා ඇමුණුම 1 ලිපියේ ඡායාස්ථ පිටපතෙහි අදාළ ප්‍රතිලාභියාගේ ඡායාරූපයක් ප්‍රාදේශීය ලේකම්ගේ අත්සනින් සහතික කර ලබාදීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

03. මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

බී.විජයරත්න
සභාපති/ කොමසාරිස්

පිටපත:
1. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කා.දැ.පි.

කාර්යාලය / அலுவலகம் / Office — Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail — welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website — www.wbb.gov.lk

……………………………………………………………(අයදුම්කරුගේ නම)                    "ඇමුණුම 1"

……………………………………………………………(අයදුම්කරුගේ ලිපිනය)

……………………………………………………………

මහත්මයාණෙනි/මහත්මියනි/මෙනවියනි,

**"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීම සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම**
**බැංකු ගිණුමක් නොමැති සහ පවත්නා ගිණුමේ වලංගුභාවය තහවුරු කරගෙන නොමැති ප්‍රතිලාභීන්**
**(ජාතික හැඳුනුම්පතක් නොමැති)**

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීමේ වැඩසටහන යටතේ මූලික තේරීම් ලැයිස්තුවට අනුව ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඔබ ද සුදුසුකම් ලබා ඇති බව දන්වමි. එහෙත් මෙම සුදුසුකම්ලාභීන්ට අදාළව අභියාචනා සහ විරෝධතා කැඳවා ඒවා පරීක්ෂා කිරීමෙන් පසුව සිදුවිය හැකි සංශෝධනවලට යටත්ව ඔබ වෙත ප්‍රතිලාභ දීමනා සෘජුව ලබාදීම සඳහා බැංකු ගිණුමක් විවෘත කිරීමට අවශ්‍යව තිබේ. එබැවින් ලංකා බැංකුවේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව හෝ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශාඛාවක ඔබේ මනාපය පරිදි ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කර ගන්න. ඔබට තැපැල් කාර්යාලයක් මගින් බැංකු ගනුදෙනු කිරීම පහසුවන්නේ නම් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැපැල් කාර්යාලීය ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කළ හැකි බව ද පෙන්වා දෙමි. ඔබට , ආරම්භක තැන්පතුවක් නොමැතිව ගිණුමක් විවෘත කිරීමටද මෙම බැංකු විසින් ඉඩකඩ ලබා දී ඇති බවද දන්වමි.ඔබ යම් කායික අපහසුතාවයකින් පෙළෙන අයෙක් නම් ඔබට විශේෂ සේවාවක් ලබාදීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එකඟ වී ඇත.

අප වෙත ඇති තොරතුරු අනුව ඔබට ජාතික හැඳුනුම්පතක් නොමැති බැවින් පහත සඳහන් ආකෘතිපත්‍රය සම්පූර්ණකර එහි සෙන්ටිමීටර් 4.5x3.5 ප්‍රමාණයේ ඔබේ උඩුකය ඡායාරූපයක් අලවා ප්‍රාදේශීය ලේකම් මගින් අනන්‍යතාවය සහතික කර බැංකු ශාඛාවට භාරදීමට කටයුතු කරන්න.

තවද ඔබට බැංකු ගනුදෙනු කිරීම සඳහා යාමේ ඒමේ අපහසුතා හා සාක්ෂරතා දුර්වලකම් ඇත්නම් නම් ඔබේ පවුලේ සාමාජිකයකු සමඟ බද්ධ ගිණුමක් විවෘත කිරීමට ද හැකියාව ඇති බවද දන්වා සිටිමි.

ස්තූතියි.

මෙයට ඔබගේ විශ්වාසී,

බී. විජයරත්න
සභාපති/ කොමසාරිස්
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

……………………
ප්‍රාදේශීය ලේකම්
(නිල මුද්‍රාව)

---

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීම සඳහා බැංකු ගිණුම් විවෘත
(ජාතික හැඳුනුම්පතක් නොමැති අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම).                    ඇමුණුම

කළමනාකරු
ලංකා බැංකුව/ ජාතික ඉතිරිකිරීමේ බැංකුව

අයදුම්කරුගේ නම:……………………………………………

ලිපිනය: ……………………………………………

……………………………………………

| |
|---|
| **4.5cmx3.5cm**<br>ඡායාරූපය |

සහතික කිරීම

……………………………………                    ……………………………………
ක්ෂේත්‍ර නිලධාරී අත්සන                    ප්‍රාදේශීය ලේකම් අත්සන

නිල මුද්‍රාව                    නිල මුද්‍රාව